ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

## පුවත්පත් නිවේදනය

## සිවකුමාර් නඩේසන් මහතා සඳහා ප්‍රවාසි භාරතීය සම්මානය

ඉන්දියානු රජය විසින් එක්ස්ප්‍රස් නිව්ස්පේපර්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ සිවකුමාර් නඩේසන් මහතා 2023 ප්‍රවාසි භාරතීය සම්මානය සඳහා තෝරා ගෙන ඇත. ප්‍රවාසි භාරතීය සම්මානය ඉන්දියානු ඩයස්පෝරා සාමාජිකයන් වෙත ඉන්දීය රජය විසින් පිරිනමන ඉහළම සම්මානය වේ. මෙම සම්මානය 2023 ජනවාරි 8-10 දිනවල ඉන්දෝර් හි පැවැත්වෙන 17වන ප්‍රවාසි භාරතීය දිවාස් සමුළුවේදි ඉන්දියානු ජනාධිපතිනි ගරු ද්‍රෞපදි මුර්මු මැතිනිය විසින් සිවකුමාර් නඩේසන් මහතාට පිරිනමනු ඇත.

2. උප ජනාධිපති ජග්දීප් ධන්කර් මහතාගේ සභාපතීත්වය සහ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතාගේ උප සභාපතිත්වය සහිත ජූරියක්/සම්මාන කමිටුවක් විසින් සිවකුමාර් නඩේසන් මහතාව මෙම සම්මානය සඳහා තෝරා ගන්නා ලදී. ඉන්දියානු ඩයස්පෝරා සාමාජිකයන් විසින් ලොව පුරා විවිධ ක්ෂේත්‍රයන්හි ළඟා කරගත් විශිෂ්ටත්වය අගයමින් ප්‍රවාසි භාරතීය දිවාස් සම්මානය පිරිනැමේ.

3. ප්‍රජා සුබසාධනය උදෙසා නඩේසන් මහතාගේ දායකත්වය අගයමින් මෙම සම්මානය පිරිනමනු ඇත. ඉන්දියානු සම්භවයක් ඇති ජනතාවගේ ගෝලීය සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාවේ වත්මන් සභාපතිවරයා ද වන නඩේසන් මහතා ප්‍රජා සුබසිද්ධිය වෙනුවෙන් මහත් කැපවීමෙන් කටයුතු කරයි. කොවිඩ් වසංගත සමයේදී ශ්‍රී ලංකාව තුළ අතරමංව සිටි ඉන්දීය ජනතාවට සහයෝගය ලබා දීම සඳහා අරමුදල් රැස් කිරීමේ කාර්යයක් ද එතුමා විසින් ආරම්භ කරන ලදී.

4. එතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ව්‍යාපාරික සහ සංස්කෘතික සබඳතා ශක්තිමත් කිරීම සඳහා සක්‍රියව කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ වැඩසටහන් ඉදිරිපත් කිරීම් සඳහා ඉන්දියානු කලාකරුවන් රැසකට ආරාධනා කිරීමේදී පුරෝගාමීව කටයුතු කර ඇත. ශ්‍රී ලංකාවේ කර්ණාටක සංගීතය වැනි සම්භාව්‍ය සහ සාම්ප්‍රදායික ක්ෂේත්‍රයන්ට අදාළ විවිධ වැඩසටහන් සඳහා ද එතුමා තම සහයෝගය ලබා දී තිබේ. එතුමා විවිධ ප්‍රවාසි භාරතීය දිවාස් සමුළු අමතා ඇති අතර 2019 කුම්භ් මේලා උත්සවයේදී අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා හමු වීමට ආරාධනා ලබා ඇත.

5. මෙම සම්මානය හිමි කරගත් දෙවන ශ්‍රී ලාංකික පුරවැසියා සිවකුමාර් නඩේසන් මහතා වන අතර 2011 වසරේදී මනෝ සෙල්වනාදන් මහතා ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා ලබා දුන් අනගි දායකත්වය වෙනුවෙන් ප්‍රවාසි භාරතීය දිවාස් සම්මානයෙන් පිදුම් ලැබීය.

***

**කොළඹ**
**2023 ජනවාරි 4**